# Parliamentary
# Research Journal

## Democracy and Development

2012

Volume : I
Number : 2

PARLIAMENT OF SRI LANKA

ISSN 2235 – 9036

Parliamentary Research Journal

**Democracy and Development**



Editor in Chief:
Neil Iddawala
*Deputy Secretary General of Parliament*

Editorial Board:
*G. Kumanayake*
*Mohammed Ajiwadeen*
*Ayesha Godagama*
*Erandathi Lokuge*
*Anjana Abeykoon*
*Harshani Wijayathilaka*



**Parliament of Sri Lanka**
Sri Jayawardenepura
Kotte, Sri Lanka.

*Email:*
journal@parliament.lk

*Web:*
www.parliament.lk

**2012**

Volume : I
Number : 02

ISSN 2235 - 9036


# Contents


*Contents* ........ *i*
*Editorial Note* ........ *ii*

**Rebuilding Postwar Sri Lanka and Issues of Development and Reconciliation: Choosing between the Eelam Demand and the Eelam Project** ........ **01**
*- Prof. Sisira Pinnawala*

**Parliamentary Democracy and Role of Backbenchers** ........ **16**
*- Neil Iddawala*

**සංවර්ධනය හා පාරිසරික දේශපාලනය** ........ **27**
*- ආචාර්ය එම්.ටී.එම්.මහීස්*

**The Nexus between Democracy and Development** ........ **35**
*- G.Kumanayake*

**Women's Representation in Local Politics: Challenges Faced by Sri Lankan Women** ........ **67**
*- Prof. Kamala Liyanage*

**සංවර්ධනය, සමාජ සංස්කෘතික වෙනස්වීම් හා ඩෙංගු රෝගය** ........ **88**
*- එරන්දතී ලොකුගේ*

**The Impact of Decentralization on Regional Development: an Enquiry based on the Provincial Council System in Sri Lanka** ........ **99**
*-M.M. Ihjas and R.Ramesh*

# සංවර්ධනය හා පාරිසරික දේශපාලනය

*Dr. M.T.M. Mahees*
*Senior Lecturer in Sociology University of Colombo*

*B.A. (Hons) in Sociology from University of Peradeniya, M.A. in Environmental Sociology from University of Colombo, PhD in Integrated Water Resource Management from PGIA.*

**හැඳින්වීම**

පරිසරය හා මිනිසා අතර පවතින්නේ ඉතා සමීප සම්බන්ධතාවයකි. නූතන මිනිසාට වාර්තමානයේ අන් කවරදාටත් වඩා පාරිසරික අර්බුදය හමුවේ නොයෙක් අභියෝගවලට මුහුණ දීමට සිදුව ඇත. එම නිසා වාර්තමාන පරිසර අර්බුද පිළිබඳව ස්වභාවික විද්‍යාඥයින් මෙන්ම සමාජ විද්‍යාඥයින් අධ්‍යයන හා පර්යේෂණවල නිරතවෙමින් සිටී. විශේෂයෙන්ම පාරිසරික සමාජ විද්‍යාව හා දේශපාලන පරිසර විද්‍යාව යන න්‍යායන් දෙක වර්තමාන පරිසර අර්බුද වඩාත් ගැඹුරු හා විවේචනාත්මක ආකාරයෙන් විශ්ලේෂණය කරමින් සිටී.

නූතන මිනිස් සමාජය අන් කවරදාටත් වඩා තම ආර්ථික හා භෞතික සංවර්ධනය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමින් සිටී. මෙවන් සීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමය හේතුකොටගෙන පරිසර පද්ධතිය දැඩි ලෙස තර්ජනයට ලක්ව ඇත. අද වන විට මිනිස් සමාජය ඉහළ යන මිහිතල උණුසුම, දේශගුණ විපර්යාස, ආහාර විෂවීම, වන විනාශය, කැලි කසල ගැටළුව, ජල අර්බුද, හා ජෛව විවිධත්වය විනාශ වීම යන ප්‍රධාන පාරිසරික අර්බුදවලට මුහුණ දෙමින් සිටී. මෙම ගැටළු ඇතිවීමට ප්‍රධානතම හේතුව වන්නේ සංවර්ධනය මුල්කරගත් මිනිස් ක්‍රියාකාරකම්ය. වර්තමාන ශ්‍රී ලංකාවද ගෝලීය පරිසර ගැටළුවට නොදෙවෙනිව නොයෙක් පරිසර අර්බුදවලට මුහුණ දෙමින් සිටී. ශ්‍රී ලංකාවේද වන විනාශය, අලි මිනිස් ගැටුම, අවිධිමත් කසල බැහැර කිරීම, පාංශු ඛාදනය, ගංවතුර, නියඟය, වැලි ගොඩදැමීම, වායු දූෂණය, ජල දූෂණය වැනි නොයෙක් පරිසර ප්‍රශ්න වර්තමානයේ දක්නට ලැබේ.

එම නිසා අදවන විට අප හමුවේ තිබෙන බොහොමයක් පාරිසරික ගැටළු එක්තරා දේශපාලන ආර්ථික මුහුණුවරක් ගන්නා බව පෙනී යයි. මෙම පාරිසරික ගැටළු නිසා නොයෙකුත් මාරාන්තික පාරිසරික සෞඛ්‍ය ගැටළුද (ඩෙංගු හා වකුගඩු රෝග) ඇතිවී ඇත. පරිසර ගැටළු හා දේශපාලන ආර්ථිකය මුල්කොටගත් සංවර්ධන ක්‍රියාදාමය අතරින් සෘජු සම්බන්ධයක් ඇතිබව නොයෙක් අධ්‍යනයන් මගින්

පෙන්වා දී ඇත. විශේෂයෙන්ම තුන්වෙනි ලෝකයේ පරිසරය දේශපාලනීකරණය වී ඇති අතර සංවර්ධන ක්‍රියාදාමය තුළින් පරිසර විනාශය හේතුකොටගෙන නොයෙක් මානව අයිතිවාසිකම් උල්ලංඝනය වන බව දක්නට ලැබේ.


එනම් ශ්‍රී ලංකාව ඇතුළු බොහොමයක් තුන්වෙනි ලෝකයේ රටවල්වල මිනිසුන්ගේ ජීවිකාව, සංස්කෘතිය, ආගමික විශ්වාසය හා ජන ජීවිතය ඔවුන් ජීවත්වන පරිසර පද්ධතිය හා ඉතා සමීපව බැඳී පවතී. සංවර්ධන ක්‍රියාදාමය හේතුකොටගෙන මෙවන් පරිසර පද්ධතියක් විනාශ වීම නිසා, මෙම ප්‍රජාවන්ගේ හෝ මිනිසුන්ගේ ජීවිකාවට හා සංස්කෘතියට අදාල අයිතිවාසිකම් උල්ලංඝනය වනු ඇත. එම නිසා පරිසර විනාශය හුදෙක් භෞතික පරිසරයට පමණක් නොව මිනිසුන්ගේ පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදයට හානියක් ඇතිකරණු ලබයි. මේ හේතුවෙන් ලෝකය පුරා අද වන විට මිනිසුන්ගේ පාරිසරික අයිතිවාසිකම් වෙනුවෙන් නොයෙක් සංවිධාන, ව්‍යාපාර, සටන් ඇරඹී ඇත. ඒවා එක්තරා ආකාරයක පශ්චාත් නූතනවාදී පාරිසරික වාදයක් ලෙස තිරසාර සංවර්ධනයක් සඳහා වර්තමාන සංවර්ධන ක්‍රියාදාමය නිසිමගට යොමුකිරීමට උත්සාහ දරමින් ඇත.

**පාරිසරික කථිකාවන්**

ලෝකයේ පරිසරය පිළිබඳව කථිකාවන් ඇතිවීමට නොයෙක් සමාජ, දේශපාලන හා බුද්ධිමය සාධක දායකවිය. පාරිසරික ගැටළු හා කථිකාවන් සමාජීය වශයෙන් සංස්කරණය හෝ නිර්මාණය කරනු ලබනු බවට නොයෙක් මතවාද ඉදිරිපත්වී ඇත (Hannigan, 2006). මෙහිදී අප විසින් අවබෝධ කරගත යුතු තවත් වැදගත් කරුණක් වන්නේ පරිසර ප්‍රශ්නයක් යනු හුදෙක් අප ඉදිරියේ භෞතික වශයෙන් දක්නට ලැබෙන හෝ අපට දැනෙන ගැටළුවක් පමණක් නොව, එය පරිසරය පිළිබඳ අනාගතයේ ඇතිවිය හැකි අවධානම් තත්ත්වයන් හෝ ගැටළුද පාරිසරික ගැටළු කථිකාවට එක්කර ගනු ලැබේ. එම නිසා පාරිසරික අවධානම (Environmental Risk) පාරිසරික කථිකාව ඇතිවීමට ප්‍රධාන වශයෙන් දායක වේ (Renn, 1992).
මේ පිළිබඳව ප්‍රකට සමාජ භූගෝල විද්‍යාඥයෙකු වූ Ulrich Beck තම Risk Society (1992) නැමති කෘතියෙන් සඳහන් කරන්නේ වර්තමානයේ අප ජීවත්වන සමාජය නොයෙක් ආකාරයේ අවදානම් හා අනතුරු තත්ත්වයන්ගෙන් පිරී පවතින බවයි. මෙහි පාරිසරික වශයෙන් ඇතිවී තිබෙන හෝ ඇතිවීමට නියමිත අවදානම් තත්ත්වය ඉතා වැදගත්ය. අප විසින් අවබෝධකර ගත යුතු වැදගත්ම කරුණු වන්නේ පාරිසරික හෝ පාරිසරික සෞඛ්‍ය වශයෙන් ඇතිවන බොහෝ අවදානම් තත්ත්වයන් සමාජ, සංස්කෘතික, හෝ දේශපාලන වශයෙන් සංස්කරණය කරනු ලබන බවයි. Mary Douglas and Wildavasky (1982) තම Risk and Culture යන කෘතියේ සඳහන් කරන්නේ අවදානම් සංස්කෘතික වශයෙන් නිර්මාණය කරනු ලබන බවයි. මීට අමතරව පාරිසරික අවදානම දේශපාලන මතවාද මගින්ද, මාධ්‍ය මගින්ද, බුද්ධිමතුන් මගින්ද අඩු වැඩි වශයෙන් සංස්කරණය කිරීම සම්මත දෙයක් බවට පත්ව ඇත.

ලාංකීය සමාජය තුළ ඇතිවන බොහොමයක් අවදානම් හෝ පාරිසරික අවදානම්-තත්ත්වයන් වන අලි මිනිස් ගැටුම, ඩෙංගු රෝගය, සහල්වල ආසනික් තිබෙන බවට ඇතිවූ කථිකාව, පොල්තෙල්වල කොලොස්ටරොල් ඇතිබව, එමෙන්ම ජංගම දුරකථනවල මයිටාවන් ඇතිබව, දේශපාලන, මාධ්‍ය හෝ බුද්ධිමතුන් විසින් සංස්කරණය කරන ලද අවදානම් තත්ත්වයන්ට කදිම නිදසුන් වේ. එම නිසා පාරිසරික වාදයට හෝ පාරිසරික කථිකාවන්ට පසුබිමක් සපයන බොහොමයක් අවදානම් තත්ත්වයන් සමාජ සංස්කෘතික, දේශපාලන මතවාදවලින් සංස්කරණය වීම වර්තමාන සමාජයේ පහසුවෙන්ම දැකගත හැකි වේ.

පාරිසරික කථිකාව පිළිබඳව පූර්ණ අදහස් ඉදිරිපත් කිරීමට Hannigan (2006) අළුත් ප්‍රවේශයක් ගෙන තිබේ. ඔහුට අනුව පිටිසර (Arcadian) පරිසර පද්ධතිය (Eco-system) යුක්තිය හෝ නීතිමය සාධක (Justice) යන කරුණු 03 මුල් කොට පරිසර කථිකාවක් ගොඩ නැගෙන්නේය. මෙහි ඉදිරිපත් කොට ඇති කරුණු 03 තවත් ආකාරයෙන් සඳහන් කරන්නේ නම්, පරිසරය පිළිබඳ කථිකාව ඇතිවීමට ස්වභාවික පරිසර සුන්දරත්වය, පරිසර පිළිබඳ විද්‍යාත්මක දැනුම හා පරිසරය පිළිබඳ සධාරණත්වය හෝ නීතිය වැදගත්වේ. එය මෙසේ රූප සටහනකින් ඉදිරිපත් කළ හැකිය.




පාරිසරිකවාදය ඇතිවීම කෙරෙහි දේශපාලනය පිළිබඳ සාධක අනෙක් කරුණු වලට වඩා වැඩි දායකත්වයක් ලබා දීම නූතන සමාජයේ දක්නට ලැබෙන සුවිශේෂී කාරණාවකි. මෙහි දේශපාලනය යනුවෙන් අදහස් කරනු ලබන්නේ පාරිසරිකවාදය කෙරෙහි බලපාන බල සම්බන්ධතාවයක් හෝ බල ධූරාවලියයි. මේ පිළිබඳව වැඩිවශයෙන් දේශපාලන පරිසර විද්‍යාව (Political Ecology) තුළින් ස ා ක ච් ඡ ා කරනු ලබයි. තවත් සහමරුන් මෙය පාරිසරික දේශපාලනය (Environmental Politics) යනුවෙන් හඳුන්වයි.

## පාරිසරික දේශපාලනය

ඉතිහාසයේ අන් කවරදාටත් වඩා පරිසරය පිළිබඳ දේශපාලනය ඉතා තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. කාල්මාක්ස් හා එංගල්ස් පරිසර ගැටළු පිළිබඳව සෘජුවම තම අදහස් ඉදිරිපත් නොකෙරුවත් ඔවුන්ගේ ධනවාදයට එරෙහිවූ අදහස් වක්‍රව පාරිසරික මතවාදයට බලපෑම් කළේය (Foster, 2001). මාක්ස් හා එංගල්ස් තවදුරටත් පවසන්නේ පරිසරය හා මිනිසා අතර නව ආකාරයක සම්බන්ධතාවයක් ඇති කර ගැනීම තුළින්, පරිසරයට සිදුවන හානිය අවම කර ගත හැකි බවය. එම සම්බන්ධතාවය පරිසර කේන්ද්‍රීය හා පරිසරය කෙරෙහි මිත්‍රශීලී විය යුතුය (Dickens, 1972). මාක්ස්ගේ මතවාදයට අනුව ධනවාදය තුළ සොබාදහම යනු වෙළඳපලේ විකිණීමට හා පරිභෝජනය කළහැකි භාණ්ඩයක් ලෙස යොදාගනු ලබයි. එමනිසා ස්වාභාවික සම්පත් එක්තරා ප්‍රාග්ධනයක් හා පුද්ගලික ලාභයක් ලෙස සලකනු ලබයි. මාක්ස් තවදුරටත් පවසන්නේ ධනවාදයෙන් නිතරම මිනිසා සහ ස්වභාවධර්මය අතර ඇති සම්බන්ධතාවය විනාශකොට ස්වභාවධර්මය ප්‍රයෝජනයට ගනිමින් ලාභ ඉපයීම සඳහා වැඩි වැඩියෙන් භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන බවයි (Gare, 1992).

මාක්ස්වාදීන්ගේ පොදු අදහසට අනුව ධනේෂ්වර අර්ථ ක්‍රමය තුළ මිනිසා විසින් භාණ්ඩ හා සේවා වෙනුවට සංකේත පරිභෝජනය කිරීම වැඩි වශයෙන් දැක ගත හැකිවේ. එම නිසා සංකේත මුල්කොටගත් සංවර්ධනය හෝ පරිභෝජන රටාවන් අළුත් පරිසර අර්බුද ඇති කරන අතර, එමඟින් සොබාදහම තව තවත් අවදානම් තත්ත්වයට ලක්වේ. සංකේත පරිභෝජන-වාදය පාරිසරික සමතුලිතතාවය විනාශකොට පරිසරය හා මිනිසා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාවය බිඳ දමා ඇත. වර්තමාන ලාංකීය සමාජය තුළ මධ්‍යම පාංතිකයන් වැඩි වශයෙන් සංකේත මුල්කොටගත් පරිභෝජන රටාවන්ට නැඹුරුවීම නිසා අප හමුවේ බොහෝ පරිසර ගැටළු ඇතිවී ඇත. තම අවශ්‍යතාවයට වඩා සුඛෝපභෝගී නිවාස ඉදිකිරීම හා මිල අධික වාහන මිලදී ගැනීම ලාංකීය සමාජයේ පරිසර ගැටළු ඉහළ යාමට කදිම නිදසුනක් වේ.

මාක්ස්වාදීන් සඳහන් කරන පරිදි පාරිසරික ගැටලු වර්තමාන ලෝකය පාලනය කරන ධනේෂ්වර ආර්ථිකයේ අතුරු ප්‍රතිඵලයකි. මෙම ධනේෂ්වර අර්ථ ක්‍රමය දේශපාලන බලය සමඟ ඉතා සමීපව කටයුතු කරයි. තවත් ආකාරයකින් සඳහන් කරන්නේ නම් ආර්ථිකය මගින් හසුරවනු ලබන දේශපාලන ක්‍රියාදාමය හේතු කොටගෙන බොහෝ පරිසර ගැටළු ඇතිවන්නේය (Mahees, 2010). බලශක්ති මුල්කොටගත් අර්බුදයන් හෝ යුද්ධයන්, න්‍යෂ්ඨික බලාගාර, අන්තරායක කැලිකසල බැහැර කිරීම, කාලගුණික විපර්යාස මෙවන් ආකාරයට දේශපාලන ආර්ථික ක්‍රියාදාමය තුළින් ඇතිකරන පරිසර අර්බුද කිහිපයක් වේ.

පශ්චාත් නූතනවාදී චින්තකයෙකු වන Michael Foucault පරිසර ගැටළු පිළිබඳ සෘජුවම තම අදහස් ඉදිරිපත් නොකළත්, මොහුගේ කථිකාවන් පරිසර ගැටළුව දේශපාලනික ප්‍රවේශයකින් අවබෝධ කර ගැනීමට ඉතා වැදගත් වේ. ෆුකෝගේ බලය හා දැනුම (Power-Knowledge) කථිකාව වර්තමාන පරිසර ගැටළු අධ්‍යයනය සඳහා බෙහෙවින් වැදගත් වේ. මෙය එක් ආකාරයකට ඔහුගේ සංකල්පයක් වූ ජෛව දේශපාලනයේ (Bio-Politics) තවත් එක් ව්‍යාප්තවීමක් ලෙසත් සැලකිය හැකිය. ෆුකෝගේ බලය හා දැනුම පිළිබඳ කථිකාව තුළ පාරිසරික කථිකාවන් උත්පාදනය, ක්‍රියාවට නංවන හා පාලනය කරන ආකාරය පිළිබඳව ඉතා මනාව සාකච්ඡා කොට ඇත (Darier, 1999). ෆුකෝගේ අදහසට අනුව පරිසරය පිළිබඳ දැනුම සකස් කිරීමටත් පවත්වාගෙන යාමටත් සමාජය හෝ දේශපාලන බල ව්‍යුහ මගින් ඉදිරිපත් කරනු ලබන කථිකාවන් ඉතා වැදගත් වේ. ෆුකෝගේ අදහස්වලට අනුව, වර්තමානයේ පවතින සමාජ පර්යාය (Social Order) හෝ බල සම්බන්ධතාවයන් සොබාදහම පාලනය කිරීම මගින් සංවර්ධන ඉලක්කයන් ළඟාකර ගන්නට උත්සාහ දරයි (Mahees, 2010).

සංවර්ධනය වන රටවල්වල දේශපාලනය හා පරිසරය අතර සම්බන්ධතාවය වඩාත් ගැඹුරින් අවබෝධ කරගන්නට තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව (Third World Political Ecology) යනුවෙන් නව ප්‍රවේශයක් ඇතිවී ඇත. තුන්වන ලෝකයේ දේශපාලන පරිසර විද්‍යාව සංවර්ධනය වන රටවල්වල දේශපාලන ආර්ථිකය හා එම සමාජයන්හි සංස්කෘතිය පදනම් කොටගෙන තුන්වන ලෝකයේ ජන සමාජයේ හා ස්වභාවික ලෝකය අතර සම්බන්ධතාවය පිළිබඳව ගැඹුරින් හා විවේචනාත්මකව අධ්‍යයනය කරනු ලබයි.

දේශපාලන පරිසර විද්‍යාව පොදුවේ සමාජය හා ස්වභාවික සම්පත් අතර තිබෙන ද්වන්ද්වාත්මක සම්බන්ධතාවය මුල්කොටගෙන පරිසර හා බල සම්බන්ධතාවය අතර තිබෙන ගණුදෙනුව පිළිබඳව ඉතා ගැඹුරින් අධ්‍යයනය කරයි (Bryant and Bailey 1997). එමෙන්ම තුන්වන ලොව දේශපාලන පරිසර විද්‍යාව ස්වභාවික සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේදී සමාජ සම්බන්ධතා, සම්පත් පාලනය කිරීම සඳහා වූ අවකාශය හා දේශපාලන හා වෙනත් තාක්ෂණික ආයතනවල මැදිහත්වීමට අදාළ බලය පිළිබඳ පැහැදිලි කරනු ලබයි (Lund and Lund, 2005). සංවර්ධනය වෙමින් පවතින රටවල්වල දේශපාලනීකරණය වූ සංවර්ධන ක්‍රියාදාමය තුළ පරිසර පද්ධතිය ලක්වන තත්ත්වය මෙමගින් පෙන්වා දෙයි. ශ්‍රී ලංකාව තුළද අද වනවිට අධිවේගී මාර්ග සංවර්ධනය, වරාය හා ගුවන් තොටුපලවල් ඉදි කිරීමේ දී ජල හෝ වෙනත් විදුලි බලාගාර ඉදිකිරීම යනාදී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එතුළින් ඇති වන සමාජ පාරිසරික ගැටළු දේශපාලනික පාරිසරික විද්‍යාත්මක න්‍යායන් මඟින් අවබෝධ කරගත හැකිය. එම නිසා ශ්‍රී ලංකාව තුළ අන්කවරදාටත් වඩා සමාජය හා සොබාදහම අතර ඇති දීර්ඝකාලීන සම්බන්ධතාවයට දේශපාලනය මුල්කොට ගත් සංවර්ධන ක්‍රියාදාමය මඟින් බලපෑම් සිදුකරමින් තිබෙයි.

ජීවිකාව, සංස්කෘතිය හා ආගමික හෝ කුල අනන්‍යතාවය නිර්ණය කරන සොබාදහමේ පැවැත්ම හා ඒවා පාලනය කිරීමේ කටයුතු අදවන විට ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමේ දේශපාලන බල සම්බන්ධතාවන් ගෙන් තීරණය කරනු ලැබීම් ශ්‍රී ලංකාව තුළ දැකගත හැකිවේ. ඒවා පිළිබඳ පුළුල් පර්යේෂණ දත්ත අප සතුව නොතිබුණද, එය අනාගතයේ දේශපාලන පරිසර විද්‍යාත්මක ක්‍රමවේදයන්ගෙන් අධ්‍යයනය කළ යුතුව තිබේ.

ස්වීඩන් ජාතික Gunnar Myrdal (1968) ගේ මෘදු රාජ්‍ය න්‍යායට (Soft State Theory) අනුව බොහෝ තුන්වෙනි ලෝකයේ රටවල්වල බොහෝ දේ පිළිබඳ නීති පනවාගෙන තිබුණද ඒවා ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ නැත. මෙම න්‍යායට අනුව ශ්‍රී ලංකාවේද පරිසර සංරක්‍ෂණය සඳහා බොහෝ නීතිරීති, කොන්දේසි හා ආයතන තිබුණද පරිසරය දිනෙන් දින විනාශයට පත්වෙමින් තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය හා පරිසර සංරක්‍ෂණය අතර සම්බන්ධතාවය පිළිබඳ නොයෙක් අදහස් ඉදිරිපත් ව ඇත. මෙතෙක් ලෝකයේ බොහෝ රටවල්වල කෙරුණ අධ්‍යයනයන් ට අනුව ප්‍රජාතන්ත්‍රවාදය සමහර අවස්ථාවන් වලදී පරිසර විනාශය අඩුකරන බවටත්, තවත් අවස්ථාවන්වලදී ඉහල දමන බවටත් කරුණු ඉදිරිපත් කොට ඇත (Li and Reuveny, 2006).

Li and Reuveny (2006) ගේ අදහසට අනුව ප්‍රජාතන්ත්‍රවාදය සහ පරිසරය අතර හේතුඵල සම්බන්ධතාවය ධනාත්මක හා ඍණාත්මක ලෙස ගොඩනැගී ඇති පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදය පවතින සමාජයක එම සමාජයේ සාමාජිකයින්ට පරිසරයට වන හානිය හා එය වළක්වා ගැනීමට අවශ්‍ය නීතිරීති දැන ගැනීමටත් ඒවා ක්‍රියාත්මක කිරීමටත් දේශපාලනමය අයිතියක් ලැබෙන බවයි. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය නිතරම මහජනතාවට වගකියන බැවින් එම ජනතාවගේ පාරිසරික ගැටළුවලට විසඳුම් සොයන්නටත් ඒවාට අවශ්‍ය ආයතන ගොඩනැගීමටත් කටයුතු කරන අතර ප්‍රජාතන්ත්‍රවාදී පසුබිමක් තුළ පරිසරය ආරක්ෂා කරනු ලබන බවටත් ඔවුන් තර්ක කර ඇත.

ප්‍රජාතන්ත්‍රවාදය හා පරිසරය පිළිබඳ අනෙක් තර්කය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ප්‍රවාහය තුළ පරිසරය වැඩි වශයෙන් විනාශවන බවයි. Midlarsky (1998) ගේ අදහසට අනුව ප්‍රජාතන්ත්‍රවාදය තුළ දේශපාලන නායකත්වයට තම ජනතාව සතුටු කරන්න සිදුවන බැවින් හා පුද්ගල හා වෙනත් බලපෑම් කණ්ඩායම්වලට කැමති පරිදි කටයුතු කරන්න අවස්ථාව ලබාදෙන බැවින් නිරන්තරතරයෙන් පරිසර නීති රීති උල්ලංඝනය කරණු ලබන බවය. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදය නිතරම වෙළඳපොල ආර්ථික ක්‍රමය තෝරා ගන්නා බැවින් පරිසරය වෙළඳපොල ආර්ථිකයට පහසුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ගොදුරුවන බව පෙනී යන්නේය.

ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය මුල්කොටගත් අනුග්‍රාහක සේවාදායක (Patron -client) දේශපාලන සම්බන්ධතාවය හේතුකොටගෙන පරිසර විනාශය ඉහල ගොස් ඇත (Mahees et al., 2009). අදවනවිට ශ්‍රී ලංකාවේ සිදු වී තිබෙන වන විනාශය, ජලදූෂණය, නායයෑම්, අලි මිනිස් ගැටුම් යනාදි පරිසර ගැටළු ඇතිවීමට අනවසර පදිංචි වීම් හෝ ජනපද බිහිකිරීම හේතු සාධක වී ඇත. මෙවන් ක්‍රියාදාමයකට ප්‍රධාන වශයෙන් පසුබිම සපයන්නේ මහජන සුබ සාධනය හෝ සංවර්ධනය නමින් ප්‍රජාතන්ත්‍රවාදය තුළින් සිදුකරන අනුග්‍රාහක සේවා දායක දේශපාලන ක්‍රියාකාරකම් ය.

## පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය

පරිසරය හෝ සොබාදහම යනු පොදු සම්පතකි. එය සමාජ පංති, ජාති, ආගම්, කුල හා පරම්පරා බේදයකින් තොරව සාමුහිකව වර්තමානයේ මෙන්ම අනාගතයටද ලැබෙන පරිදි බුක්ති විඳිය යුතුය. නමුත් වර්තමානයේ සංවර්ධන ක්‍රියාවලිය තුළ බොහෝ ස්වභාවික සම්පත් එක්තරා ජන කොටසක් විසින් පමණක් වැඩි වශයෙන් භුක්ති විඳින අතර ඔවුන් විසින් විනාශ කරන පරිසර පද්ධතියේ අනිසි ප්‍රතිඵලවලට තවත් ජන කොටසක් ගොදුරු බවට පත්වේ. ප්‍රකට පරිසරවේදිනියක් වන Vandana Shiva (1991) ට අනුව, තුන්වෙනි ලෝකයේ බොහොමයක් සංවර්ධන ව්‍යාපෘති මුල්කොටගෙන තරඟකාරී හා ගැටුම්කාරී කණ්ඩායම් දෙකක් බිහිවී ඇත. එනම් සංවර්ධන ව්‍යාපෘති මගින් යහපත් ප්‍රතිඵල අත්පත් කරගන්නා පිරිස සහ සංවර්ධන ව්‍යාපෘති නිසා පීඩාවට පත්වන පිරිස වශයෙනි. නිදසුනක් ලෙස කොළඹ ගාල්ල අධිවේගී මාර්ග සංවර්ධනය නිසා එම මාර්ගයේ වාහන මගින් ගමන් කරන වරප්‍රසාදලාභී පන්තිය එම සංවර්ධනය ධනාත්මක ලෙස භුක්ති විඳින අතර, තම ඉඩම්, කුඹුරු, පරිසරය හා බැඳුනු සංස්කෘතිය අහිමිකරගත් මාර්ගය දෙපස සිටින තවත් කොටසක් මෙම මාර්ගය නිසා පීඩාවට පත්වේ. සංවර්ධන ක්‍රියාදාමය මගින් පරිසර පද්ධතියට සිදුවන හානිය නිසා පරිසරය පදනම් කොටගත් ජීවිකාව, චාරිත්‍රවාරිත්‍ර, ඇදහිලි විශ්වාස

කුලය වැනි දේ භෞතික පරිසරයට අමතරව අහිමි වේ. මෙය එක්තරා ආකාරයක පරිසරය මුල්කොටගත් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි. මෙවන් පසුබිමක් මුල්කොටගෙන පාරිසරික අයිතිය හෝ පරිසර ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය ශීඝ්‍ර යෙන් ජනප්‍රිය විය. මෙම කථිකාව ඉතා පුළුල් ලෙස පාරිසරිකවාදය, (Environmentalism) පාරිසරික ව්‍යාපාර (Environmental Movements), ගැඹුරු පරිසර විද්‍යාව (Deep Ecology) හා පාරිසරික ස්ත්‍රීවාදය (Ecofeminism) යන ක්ෂේත්‍ර තුළද සාකච්ඡා විය. Fotopoulos (1997) යන චින්තකයාට අනුව පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය යනු එක් සමාජ කණ්ඩායමක් මගින් සොබාදහම පාලනය කරනු ලැබීම නවතා දැමීමට යොදාගත හැකි සමාජ දේශපාලන යාන්ත්‍රණයකි. පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය මගින් මිනිසාව හා සොබාදහම යුක්තිසහගත ලෙස ප්‍රතිසංවිධාන ගතකිරීමකට ලක් කරයි. ආර්ථික හෝ දේශපාලන බලය මගින් ස්වභාවික සම්පත් එක්තරා කණ්ඩායමකට පමණක් සීමා කිරීමට විරුද්ධව කටයුතු කරන සමාජ ව්‍යාපාරයක් ලෙස පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය හඳුන්වා දිය හැක.

පාරිසරික ප්‍රජාත්‍රන්ත්‍රවාදයේ තවත් වැදගත් කරුණක් වන්නේ සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේදී හා පරිසර නීති රීති ක්‍රියාවට නැංවීමේදී සියලු පුරවැසියන් කිසිදු විෂමතාවයකින් තොරව සමාන ලෙස සැලකිය යුතු අතර පරිසර සංරක්ෂණ කටයුතුවල ජනතාව අර්ථවත් ලෙස සහභාගී විය යුතු බවය. පරිසර පද්ධතිය බොහෝ දෙනාගේ ජීවිකාව, සංස්කෘතිය, ආගමික ඇදහිලි හා කුල අනන්‍යතාවයන් සමග ඉතා සමීපව බැඳී පවතී. පරිසර පද්ධතියට එල්ලවන ඕනෑම හානියක් පරිසරය පදනම් කරගෙන පවතින ඉහත සඳහන් සියළුම කරුණුවලට දැඩි සේ බලපෑම් කරයි. නිදසුනක් ලෙස Sumi Krishna (1996) ට අනුව කුලයක් හෝ ගෝත්‍රයක් නිශ්චිත පරිසර පද්ධතියක් තුළ තම ජීවකාව සපුරා ගනිමින් තමන්ගේම අනන්‍යතාවයක් සහිතව ජීවත්වෙමින් සිටියද යම් ආකාරයකින් ඔවුන් ජීවත්වන පරිසර පද්ධතියට හානියක් සිදුවූ විට ඔවුන්ගේ ජීවිකාව සහ සංස්කෘතිය මුලිමනින්ම බිඳ වැටේ. මෙවන් ආකාරයෙන් පරිසර පද්ධතියට සිදුවන හානිය නිසා ඉන්දියාව සහ අනෙකුත් තුන්වන ලෝකයේ රටවල්වල ගෝත්‍ර සහ කුල දැනටමත් විනාශයට පත්ව ඇත.

Weston (2012) සඳහන් කරන ආකාරයට වර්තමානයේ ජීවත්වන අපට ජීවත් වීමට අවශ්‍ය අපගේ සංස්කෘතිය වූ, භාෂාව, දැනුම, තාක්ෂණය, අගයන්, චාරිත්‍ර වාරිත්‍ර, නීති රීති, මෙන්ම අපට සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට අවශ්‍ය පරිසරය අපගේ මුතුන් මිත්තන් අපට නිසිලෙස දායාද කළේය. එම සංස්කෘතිය හා පරිසරය එලෙසින්ම අපේ අනාගත පරම්පරාවට සුරක්ෂිතව ලබා දීම වර්තමානයේ ජීවත්වන අපගේ පරම යුතුකමක් වේ. අප විසින් අනාගත පරම්පරාවට සංස්කෘතිය උරුම කර දුන්නත් අප විසින් අනාගත පරපුරට ලබා දෙන්නේ විනාශවූ පරිසර පද්ධතියක්ය. අනාගත පරපුරට තම සංස්කෘතිය හා ජීවිකාව හොඳින් පවත්වාගෙන යාමට පරිසර පද්ධතිය ඉතාමත් අත්‍යාවශ්‍ය කාරණාවකි. එම නිසා සංස්කෘතිය හා ජීවිකාව මුළුමනින්ම නිර්ණය කරනු ලබන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම අපගේ යුතුකමක් වන අතර එය අනාගත පරම්පරාවේ අයිතිවාසිකමකි. මෙවන් පරිසර පද්ධතියක් විනාශකොට ඔවුන්ගේ පාරිසරික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම අප විසින් කරන සදාචාර විරෝධී ක්‍රියාවකි.

අද වනවිට ලෝකය පුරා සිදුවන සංවර්ධන ක්‍රියාදාමය හේතුකොට ගෙන ගෝලීය වශයෙන් අන් අයගේ පරිසර අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව හඬ නගනු ලබමින් සිටී. න්‍යෂ්ටික බලාගාර, විශාල පරිමානයේ ජල විදුලි බලාගාර, අධිවේගී මාර්ග, යාන්ත්‍රී කෘෂිකර්මාන්තය හා ජල ව්‍යාපෘතීන් හේතුවෙන් එම ව්‍යාපෘතිවල කිසිසේත් අදාළ නැති අයගේ පාරිසරික අයිතීන් උල්ලංඝනය වෙමින් තිබේ. උදාහරණයක් ලෙස ජපානයේ න්‍යෂ්ටික බලාගාරයක් අවට රටවල ජනතාවගේත්, දකුණු ඉන්දියාවේ කර්මාන්තශාලා ශ්‍රී ලංකාවේ ජනතාවගේත්, නගරයක ජනයා විසින් බැහැර කරන කැලි කසල ග්‍රාමීය ජනතාවගේත්, කඳුරට යොදන පොහොර රජරට ජනතාවගේ පාරිසරික අයිතීන් ද උල්ලංඝනය කරමින් තිබේ. විශේෂයෙන්ම මිහිතලය උණුසුම් වීම, කාලගුණ විපර්යාස, ජලය හා වායු දූෂණය මගින් ඇතිවන රෝග පරිසර අයිතීන් උල්ලංගනය වීමට අදාළව වැඩි වශයෙන් සාකච්ඡාවට බඳුන් වේ.

පාරිසරික දේශපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය

පිළිබඳ කථිකාව තුළ පාරිසරික ස්ත්‍රීවාදයට ප්‍රධාන තැනක් හිමිවේ. පාරිසරික ස්ත්‍රීවාදීන්ගේ අදහසට අනුව සොබාදහම ස්ත්‍රියටත් සංස්කෘතිය පුරුෂයාටත් සමාන වේ. පුරුෂයන් ස්ත්‍රියන්ව පාලනය කරන ආකාරයෙන්ම සංස්කෘතිය විසින් සොබාදහම පාලනය කරනු ලබන්නේය. පුරුෂාධිපත්‍යය මුල්කොටගත් ධනවාදය සොබාදහම මෙන්ම කාන්තාවද සූරාකමන් සිටී. එම නිසා පාරිසරික ස්ත්‍රීවාදීන් සොබාදහමේ සහ කාන්තාවන්ගේ විමුක්තිය උදෙසා සටන් කරමින් සිටී. Mies and Shiva (1993) හා Agarwal (1997) යන අයගේ අදහස්වලට අනුව පුරුෂාධිපත්‍ය මුල්කොට ගත් සංවර්ධන ක්‍රියාදාම මගින් සිදුකරන පරිසර සංහාරය හේතුකොටගෙන ද වැඩි වශයෙන් පීඩාවට පත්වන්නේ කාන්තාවන්, දරුවන් හා ආර්ථික හා බලය අතින් දුර්වල පුරුෂයින්ය. මෙම පාරිසරික ස්ත්‍රීවාදයේ පසුබිම පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය මගින් ඇතිවූ බවට මෙයින් තහවුරු වේ. එම නිසා පාරිසරික කාන්තාවාදය හා පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදය එකම කාසියක දෙපැත්තක් මෙන් එකම කාර්යයේ යෙදී සිටී.

විශේෂයෙන්ම තුන්වෙනි ලෝකයේ රටවල්වල සංවර්ධනය හේතුකොටගෙන ඇතිවන පාරිසරික අයිතීන් උල්ලංඝනය වීම නිසා එම සමාජවල පාරිසරික ව්‍යාපාර වැඩි වශයෙන් ඇතිවීමේ ප්‍රවනතාවක් ඇත. සංවර්ධන ව්‍යාපෘති හේතුකොටගෙන එමගින් තම පාරිසරික අයිතීන් අහිමිවන නිසා ගොවියන්, ධීවරයන් හා කාන්තාවන් ජාතික හෝ බිම්මට්ටමින් සාමූහික පාරිසරික ක්‍රියාකාරකම්වල (Collective Grassroots Environmental Actions) වැඩි වශයෙන් නිරත වේ. (Mahees, 2010) ඉන්දියාවේ නර්මදා වේල්ල ඉදිකිරීමට විරුද්ධව ඇති වූ පාරිසරික ව්‍යාපාරයට වැඩි වශයෙන් ගොවියන්, කාන්තාවන් හා ගෝත්‍රිකයන් ද දායක විය. එමෙන්ම ශ්‍රී ලංකාවේ නොරොච්චෝලේ ගල්අඟුරු බලාගාරයට එරෙහිව ගොවියන්, ධීවරයින් මෙන්ම සුළු ජාතික ජනකොටස් සාමූහිකව කටයුතු කර තම පරිසර පද්ධතියන් රැක ගැනීමට උත්සාහ කළේය. මෙමගින් පෙනී යන්නේ පරිසර ව්‍යාපාරය හෝ පාරිසරිකවාදය, පාරිසරික ප්‍රජාතන්ත්‍රවාදයට අත්‍යවශ්‍යම සාධකයක් බවය.

## නිගමනය

වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ දියුණු වෙමින් පවතින රටවල්වල ශීඝ්‍රයෙන් ඇතිවන සංවර්ධන ක්‍රියාදාමය නිසා පරිසර පද්ධතියට දැඩි බලපෑමක් එල්ල වෙමින් තිබේ. පරිසර පද්ධතිය එම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවිකාව, ආගමික ඇදහිලි, සංස්කෘතික කටයුතු, සාමුහිකත්වය මෙන්ම අනන්‍යතාවයට පදනමක් සපයමින් තිබේ. සොබාදහම යම් සමාජයක සෑම දෙනාගේ පොදු සම්පතක් වුවද අද වනවිට, එය සුළු පිරිසක් පමණක් භුක්ති විඳිමින් වැඩි බහුතරයකට ස්වභාවික සම්පත් භුක්ති විඳීමේ අයිතීන් සීමා කර දමමින් තිබේ. එමෙන්ම වර්තමානයේ සංවර්ධනයේ නාමයෙන් පරිසර පද්ධතියට සිදුකරන හානිය අනාගත පරම්පරාවේ පරිසර අයිතීන් උල්ලංඝනය කිරීමක් වේ. එම නිසා වර්තමානයේ සංවර්ධන ක්‍රියාවලීන් ක්‍රියාවට නැංවීමේදී ආර්ථික හෝ දේශපාලන බලය නැති ජන කොටස්වල මෙන්ම අනාගත පරම්පරාවේ පරිසර අයිතීන් පිළිබඳවද ඉතා ගැඹුරින් සිතා බැලිය යුතුය. එම නිසා අප ජීවත්වන සමාජයේ තියෙන සියළු සොබාවික සම්පත් එම සමාජයේ ජීවත්වන සෑම දෙනාට මෙන්ම අනාගත පරම්පරාවට සාමූහිකව භුක්ති විඳීමේ අයිතිය සමාජ හා දේශපාලන වශයෙන් සුරක්ෂිත කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය නීතිමය පසුබිම මෙන්ම දේශපාලන පසුබිම සකස් කළයුතු අතර එම නීතිමය හා දේශපාලන පසුබිම් රැකගැනීමට අවශ්‍ය සමාජ යාන්ත්‍රණය සමාජය තුළ සාමූහිකව ස්ථාපිත කළයුතුය.

### References


Agarwal, B. (1997). The Women, Gender and Development, "The Gender and Environment Debate", Lesson from India. London: Zed Books Ltd.

Beck, U. (1992). *Risk Society*; Towards a New Modernity, London: Sage.

Bryant, R. L. and Bailey, S. (1997). *Third World Political Ecology*. London: Routledge.

Darier, E. (1999). *Discourse of the Environment*. Oxford: Back Well Publication.

Dickens, P. (1992). *Society and Nature*: Towards a Greener Social Theory. Hemel Hempstead: Harvester Wheatsheaf.

Douglas, M. and Wildavasky, A. (1982). Risk and Culture: An essay on the selection of Technological Environmental danger, Berkely: University of California Press.

Foster, J. B.(2001) Marx' Ecology. India, Cornerstone Publication.

Fotopoulos, T. (1997). Towards An Inclusive Democracy. London / New York: Continuum.

Gare, G.A. (1995). *Post-modernism and Environmental Crisis*. London: Routledge.

Hannigan, J. (2006) Environmental Sociology. London and New York: Routledge.

Krishna, S. (1996). Environmental Politcs. New Delhi: Sage Publication.

Li, Q, and Reuveny, R. (2006). Democracy and Environmental degradation: International Studies Quarterly 50: 935-956.

Lund, S. and Lund, C. (2005). Power, Development and Environment: an introduction, The Journal of Transdisciplinary Environmental Studies. 4 (2) Available on: http://www.journal-tes-dk.

Mahees, M.T.M., Sivayoganathan, C., and Basnayaka, B.F.A.( 2009). Political Economy of Water Pollution in River Mahaweli. Kandy: Water Resources Research in Sri Lanka by Geo-Informatics Society of Sri Lanka.

Mahees, M. T.M, (2010). *Environmental Movements in Sri Lanka*, Germany: VDM Publisher.

Midlarsky, M. (1998). Democracy and Environment: an empirical assessment, Journal of Peace research. 35: 341- 356.

Mies, M. and Shiva, V. (1993). Ecofeminism, New Delhi: Kali for Women.

Myrdal, G. (1968). The Soft State in Underdeveloped Countries, Available on: *http://heinonlinebackup.com/hol*-cgi-bin/get_pdf.cgi?handle=hein.journals/.

Renn, O. (1992) Concepts of Risk , *social theories of risk (ed)* Westport, Praeger.

Shiva, V. (1991). Ecology and the Politics of Survival. New Delhi: Sage publication.

Weston, B. H. (2012). The Theoretical Foundation of Intergenerational Ecological Justice: An Overview. Human Right Quarterly 34: 251 – 266 John Hobkin University Press.